

# 21

# ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය දැක්ම



ඉස්ලාම් ආගම මනුෂ්‍ය ජීවිතයේ සියලු ම අංශවලට සුදුසු මගපෙන්වීම් දැක්ම සහිත ආගමක් වන අතර ආර්ථිකය හසුරුවීම පිළිබඳ ශ්‍රේෂ්ඨ මගපෙන්වීමක් ද (මාර්ගෝපදේශනයක්) ලබා දෙයි.

ආර්ථිකය යන වචනය භාවිත වන්නේ මිනිස් ශ්‍රමය නොමැති ව ළඟා කර ගත නොහැකි මිනිස් අවශ්‍යතා සැපිරීම සඳහා වූ සම්පත් හැඳින්වීම සඳහා ය. එලෙස ම මිනිසාගේ මූලික අවශ්‍යතා :ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස හා සමාජයේ දියුණුවක් සමග ම ඇති වූ අධ්‍යාපනය, ආරක්ෂාව, සන්නිවේදනය, විනෝදය වැනි වෙනත් අවශ්‍යතා සපුරාලීම ඕනෑම ආර්ථිකයක ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා ක්‍රියාත්මක කරන විවිධ ක්‍රම ආර්ථික ක්‍රම වන අතර එම ක්‍රම පිළිබඳ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව නම් වේ.

ආර්ථිකය පිළිබඳ මිනිසුන්ගේ අරමුණු සහ ඒවා ළඟා කර ගැනීමට ඔවුන් දරන උනන්දුව එකිනෙකට වෙනස් ය. එම නිසා මිනිසුන්ගේ ආර්ථික මට්ටම් ද වෙනස් ය. සමහරෙක් ආර්ථිකයේ උසස් මට්ටම්වල ද, තවත් සමහරෙක් පහත් මට්ටමේ ද තවත් සමහරෙක් මධ්‍යස්ථ ව ද සිටිති. මේ සියලු දෙනාගේ ම ආර්ථික අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන සැලැස්ම ශ්‍රේෂ්ඨ ආර්ථික ක්‍රමයක් වේ.

මිනිසාගේ ආර්ථික අර්බුද විසඳා ගැනීමට යොදා ගන්නා ප්‍රධාන ආර්ථික සංකල්ප දෙකකි. එනම්,

1. ධනවාදී ආර්ථික ක්‍රමය
2. සමාජවාදී ආර්ථික ක්‍රමය

පෞද්ගලික අංශයේ උන්නතිය සඳහා මූලිකත්වය ලබා දෙන ආර්ථික ක්‍රමය ධනවාදී ආර්ථික ක්‍රමය වන අතර පෞද්ගලික අංශයට පමණක් සීමා වූ ආර්ථික අභිවෘද්ධිය පිටු දකින සම්පත් සියල්ල ජන සතු කරන ආර්ථික ක්‍රමය සමාජවාදී ආර්ථික ක්‍රමය වෙයි. මේ සංකල්ප දෙක ම මධ්‍යස්ථ නොවේ. මේ තුළින් ලෝක ආර්ථිකයේ විසඳිය නොහැකි අභියෝග රැසක් බිහි වී ඇත. නමුත් ඉස්ලාම් මධ්‍යස්ථ ආර්ථික සංකල්පයක් හඳුන්වා දී ඇත. එය පෞද්ගලික අංශයේ ආර්ථිකයට හා පොදු සමාජ ආර්ථිකයට ද යහපත ගෙන දේ.

ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප දෙකක් තිබේ.

01. (විශ්වාසය හා සම්බන්ධ) ප්‍රතිපත්තිමය කරුණු
02. ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූලික කරුණු.

**01. විශ්වාසය හා සම්බන්ධ ප්‍රතිපත්ති මය කරුණු :-**

**⋆ සියලු ම සම්පත් අල්ලාහ්ගේ ය. ඒවා මිනිසා වෙනුවෙන් බිහි කළේ ය.**

''තව ද අහසේ සහ භූමියේ තිබෙන ඒවාත් අල්ලාහ්ගේ ය. (53:31)''

භූමියේ තිබෙන සියලු දේ ඔබ වෙනුවෙන් බිහි කළේ ඔහු ය.

**⋆ ධනවත්කම ගැන කියාමත් දිනයේ විමර්ශනය කරනු ලැබේ.**

**ඔබට අල්ලාහ් තආලා ලබා දුන් දායාද ගැන ද කියාමත් දිනයේ විමර්ශනය කරනු ලැබේ. (102:08)**

**⋆ පෞද්ගලික දේපල / ධනයෙන් කොටසක අයිතිය සමාජයට ද ඇත.**

''ඔවුන්ගේ ධනයෙන් නිශ්චිත ප්‍රමාණයක අයිතිය නැති බැරි අයට සහ යාචකයින්ට ඇත. (70:24-25)''

**⋆ ධනය ඉපැයීමට දරන උත්සාහය සාර්ථක හෝ අසාර්ථක වන්නේ අල්ලාහ්ගේ අභිමතය පරිදි ය.**

''ඇත්ත වශයෙන් ම අල්ලාහ් තමා කැමති අයට වැඩියෙන් හෝ අඩුවෙන් ලබාදෙන්නේ (17:30)''

**⋆ ධනය / සම්පත් මිනිසා පරීක්ෂණයට භාජනය කිරීම සඳහා ලබා දී ඇති ඒවා වේ.**

' නිශ්චිතව ම ඔබේ ධනය හා දරුවන් ඔබ පරීකෂණයට භාජනය කිරීම සඳහා ම ඇත්තේ ය.' (64:15)

ඉහත සඳහන් විශ්වාසය හා සම්බන්ධ වූ ප්‍රතිපත්තිමය කරුණු ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ ප්‍රාණය වෙයි. ඒ අනුව ධනවාදි සහ සමාජවාදි ආර්ථික ක්‍රම තුළින් මිනිසුන්ට ලබා ගැනීමට නොහැකි වූ නිදහස, මානසික තෘප්තිය, මානසික සුවය, ඉස්ලාමීය ආර්ථික ක්‍රමය තුළින් ලබා ගත හැකි ය.

## 02 ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූලික කරුණු

⋆ අල්ලාහ්ට ස්තුතිය පුද කිරීම

මෙය මා ඔහුට ස්තුතිය පුද කරනවා ද නැද්ද යන්න පරීක්ෂා කිරීමට මාගේ දෙවියා මට දුන් දයාදයකි. (27:40)

**⋆ සකාත්, සදකා හා වෙනත් දන මානවලින් සමාජයට හිමි කොටස ලබා දීම.**

'දන් සියල්ල දූගීන්, දුප්පතුන්, දන් රැස් කරන්නන්, නවමු ඉස්ලාම් භක්තිකයින්, ණය බරින් මිරිකී සිටිනවුන්, අල්ලාහ් වෙනුවෙන් සටන් වදිනවුන්, මගීයාචකයින් හට හා වහලුන් නිදහස් කිරීමට හිමි මෙව අල්ලාහ් නියම, කර ඇති වගකීමකි. අල්ලාහ් සියලු දේ පිළිබඳ දැනුවත් මහා ඥාණවන්තයෙකි (9:60)

**⋆ වැය කිරීමේ දී සහ ඉතිරි කිරීමේ දී මධ්‍යස්ථ වීම.**

''(ඔබගේ ධනයෙන් කිසිවක් වැය නොකර) සියල්ල ඉතිරි කර බෙල්ලේ එල්ලා නොගනු ! තව ද ඔබගේ ධනය සියල්ල වැය කොට හිස් අතින් ද නොසිටිනු '' (17:29)

**⋆ කුමන හෝ ආර්ථික ක්‍රියාදාමයක වුව ද පොළිය අන්තර්ගත නොවීමට වග බලා ගැනීම.**

''පොළී ලබාගෙන පරිභෝජනය කරන වුන් සාතන් ආවේශ වී නැගිටින වුන් ලෙස මිස නැගිටින්නේ නැත.''(2:275)

**⋆ අල්ලස, රැවටීම, සූදුව, දූෂණය වැනි හර පද්ධතීන්ට විරුද්ධ වූ ක්‍රියාවලින් සම්පූර්ණයෙන් ම වැළකී සිටීම.**

''කෙනෙක් තවත් කෙනකුගේ දේපල අසාධාරණ ලෙස පරිභෝජනය නොකරන්න ''

''(ඔබේ මතය බොරු බව) ඔබ දැන සිටිය ද (වෙනත්) මිනිසකුගේ වස්තුන් කිසිවක් පාපයෙන් පිරුණු මාර්ගයකින්/ ක්‍රමයකින් (අසාධාරණ ලෙස අල්ලස් දී) අත්පත් කර ගැනීම ට නිලධාරීන් වෙත නොයනු'' (2:188)

**⋆ කාලය හා වතාවරණයන් තුළින් ඇති වන ආර්ථික අවශ්‍යතා, වෙනස්වීම් හා, ව්‍යාකූලතා ඉස්ලාමීය විද්වතුන් විසින් ඉජ්තිහාද් කර නිරාකරණය කළ යුතු යි.**

මෙම මූලික කරුණු හේතු කොට ගෙන ඉස්ලාමීය ආර්ථික ක්‍රමය සියලු ම කාල වකවානු වලට යෝග්‍ය පරිදි සකස් වී ඇත.

★ ඒකගතාවය මත සිදු කරන ආර්ථික ක්‍රියාකාරකම් සාක්ෂි සහිතව ලේඛන ගත කිරීම. 'විශ්වාසවන්තයිනි! ඔබ නිශ්චිත කාල සීමාවක් සඳහා ණය දුන්නොත් එය ලිඛිත ව තබා ගැනීම යෝග්‍ය වෙයි. (2:282)

ඉස්ලාමීය ආර්ථිකයේ මෙම මූලික කරුණු දෙක සඳහා සාක්ෂි ලෙස මෙහි දී අල් කුර්ආන් වාක්‍යය පමණක් ලබා දී ඇත. මේ කරුණු ශක්තිමත් කිරීමට විවිධ හදීස් ඇත. ඒවා අල් කුර්ආන් වාක්‍යය වලට සමාන්තර වෙයි. මුහම්මද් නබි (සල්) තුමා මුස්ලිම් සමාජයේ මෙම සිද්ධාන්ත ක්‍රියාවට නංවා පෙන්වූයේ ය. එම ආදර්ශය අනුගමනය කළ කලීෆා වරුන්ගේ පාලන කාලය තුළ සිටි මුස්ලිම්වරු එහි ප්‍රතිඵල අත්දුටුහ.

## ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ වැදගත් කරුණු

★ **දේව ගුණාංග :-**

ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ දී අල්ලාහ්ගේ මාර්ගෝපදේශය පදනම් කරගෙන ඇත. ඒ නිසා මිනිසා නිර්මාණය කළ ආර්ථික ක්‍රම තුළ ඇති අඩුපාඩු මෙන් මෙහි අඩුපාඩු කිසිවක් දක්නට නැත.

★ **සමාජය තුළ පැන නගින ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම :-**

ඉස්ලාම් ධර්මයේ ඇති සාර්ථක බෙදා හැරීමේ ක්‍රමය මෙයට හේතු වේ. ඔබගේ ධනය ධනපතීන් අතර පමණක් රැඳීමට නොදී (අන් අයට ද ලැබීමට ධනය මෙලෙස) බෙදා දෙන ලෙස අණ කරන්නේ ය. (59:7)

★ සමාජ යහපත සහ පෞද්ගලික යහපත අතර සම්බන්ධතාවක් ඇති කිරීම :-

මෙ නිසා ඉස්ලාමීය ආර්ථික ක්‍රමය ධනවාදී හා සමාජවාදී ආර්ථික ක්‍රමවලින් වෙනස් වේ.

★ ආධ්‍යාත්මික අවශ්‍යතා සහ ලෞකික අවශ්‍යතා ගැන සම ව සැලකිල්ලට යොමු කිරීම.

දැනට පවතින ආර්ථික ක්‍රමය ලාභය හැර වෙනත් අංශවලට ප්‍රමුඛත්වයක් ලබා දෙන්නේ නැත. ඉස්ලාමීය ආර්ථිකයේ ලාභය පමණක් නොව හැඟීම්, ගතිගුණ, ශිෂ්ටභාවය සංස්කෘතිය, යනාදියට ද වැදගත් තැනක් හිමි වෙයි.

කිසි කෙනකුට අසාධාරණයක් නොවීම.මෙය ඉස්ලාමීය ආර්ථික ක්‍රියාකාරකම් වල ඉතා වැදගත් අරමුණකි.අසාධාරණය කරන්නේද නැත. අසාධාරණයට ලක් වන්නේද නැත.(2:279)

★ **නම්‍යශීලිභාවය :-**

ආර්ථික ක්‍රියාකාරකම් 'මුආමලාත්' වලට සම්බන්ධ නිසා ඉස්ලාම් වළක්වා ඇති සමහර දේ හැර අන් ඒවාට අනුමැතිය දී තිබේ. මෙහිදී, ආර්ථික ක්‍රියාකාරකම් වලට යොමු වීමේ දී නව්‍යතා බොහොමයක් ඇති වීමට ඉඩ ඇත. එවිට එම නව්‍යතා 'ඉජ්තිහාද්' යට ලක් කර 'ෂරී ආ' වට ගැලපෙන පරිදි එම නම්‍යතා පිළිබඳ තීන්දු ලබා ගත හැක.

★ **බරකත් :-**

ඉස්ලාමීය ආර්ථික ක්‍රමය 'වහී' පදනම් කරගෙන නිර්මාණය වී ඇත. ලෝ වැසියන් සියලු දෙනාට ම ගැලපෙන ආර්ථික ක්‍රමයක් ලෙස මෙය සැකසී ඇත. නියත වශයෙන්ම මෙය අනුගමනය කිරීමෙන් අල්ලාහ්ගේ ආනිසංස, දයාව හා බරකත් නම් වූ වර්ධනය නොඅඩු ව ලැබෙනු ඇත.

වෙනස් මත එකිනෙකට විරුද්ධ වීම ස්වාභාවික වේ. ධනවාදී ආර්ථික දර්ශනය හා සමාජවාදී ආර්ථික දර්ශනය එකිනෙකට විරුද්ධ වන්නේ ද මේ නිසා ය. ඉස්ලාමීය ආර්ථික දර්ශනය මේ දෙකට ම වෙනස් වන නිසා ධනවාදී හා සමාජවාදි ආර්ථික දර්ශනයන් ඉස්ලාමීය ආර්ථික දර්ශනයට විරුද්ධ වේ. මුස්ලිම්වරු වන අප ඉස්ලාමීය ආර්ථික දර්ශනය අප පෞද්ගලික හා සාමාජීය ජීවිතයේ දී පිළිබිඹු කිරීම හා එහි වටිනාකම ලෝ වැසියන් හට ගෙනහැර දැක්වීම අපගේ වගකීමකි.මෙසේ කිරීමෙන් අපට පරලොවේ දී මෙන් ම මෙලොව දී ද ජයග්‍රහණය ලබා ගත හැක.

**අභ්‍යාස**

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

01. ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප වර්ග කළ හැක්කේ කෙසේ ද?

02. ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප වර්ග දෙක මොනවා ද?

03. ඉස්ලාමීය ආර්ථිකයේ වැදගත්කම පිළිබඳ විස්තර කරන්න.

**ක්‍රියාකාරකම්**

"ලෝ වැස්සන් මුහුණදෙන වර්තමාන ආර්ථික ගැටලුවලට ඉස්ලාමීය ප්‍රතිපත්ති තුළින් විසඳුම් ලබා ගත හැකි ය" යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.